**ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනයන් සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා වූ ඡේදවල සඳහන් කර

ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගතවී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසිය** | | | |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 01. ව්‍යාපෘති නිම නොකිරීම | 2.3.1(අ) |
| | | 02. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.1(ආ) |
| | | 03. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.3.1(ඇ) |
| | | 04. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම | 2.3.2 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත්කරන බව | 01. පොදු තැන්පත් ගිණුමේ අඩුපාඩු | 2.9<br>2.10 |
| | | 02. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.11 |
| | | 03. පොත්පත් හා ලේඛන පවත්වා නොගැනීම | 2.12 |
| 128(1)(ඉ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්යය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | 04. මානව සම්පත් කළමනාකරණයේ දුර්වලතා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වීම | 2.8 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල | පාඩු හා හානි | 2.4 |

නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්**

(අ) කාර්යක්ෂමතාවයෙන් යුතු දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය

(ආ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික්කයේ පොදු ජනතාවට පිරිසිදු රාජ්‍ය සේවාවක් ලබාදීම

(ඇ) සංස්කෘතික සිරිත් විරිත් හා ශාරීරික හා මානසික යහ පැවැත්ම

(ඈ) ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ සිටින ජනතාවගේ අධ්‍යාපන , සෞඛ්‍ය හා කෘෂිකර්ම ආදියට උපකාර කරන අතර දිළිඳු මට්ටම තුළ සිටින අයවලුන්ට සහනාධාර හා ජීවනාධාර උපකාර ලබා දීම.

**2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරයන් පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරී බලය | කාර්යභාරය |
|---|---|---|
| කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>කන්දවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>පච්චිලයි පල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>පූනාකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | මධ්‍යම රජය සහ පළාත් සභාවලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්යභාරයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම. |

**2.3 කාර්යසාධනය**

**2.3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

2016 සහ 2017 වර්ෂවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් කන්දවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සහ පෙරියකුලම් අමුණ ප්‍රතිසංස්කරණ කටයුතු යන ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 41.24 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘතිවල කටයුතු ආරම්භ කර තිබුණත් කොන්ත්‍රාත්කරුවන් සමඟ වූ මත ගැටුම් හේතුවෙන් එම ව්‍යාපෘති මේ දක්වා නිම නොකර අතහැර දමා තිබුණි.

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**----------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී මසාර්, කොල්ලක්කුරිච්චි කරදිය අමුණ, මාවිලංගෙයි වැව සහ කුලම්බියා වැව යන ව්‍යාපෘති සඳහා රු.මිලියන 9.14 ක වටිනාකමට ගිවිසුම්ගතව ව්‍යාපෘති 04 ක් ආරම්භ කර තිබූ නමුත් අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකි වී තිබුණි. එම ව්‍යාපෘති සඳහා මාස 08 ක කාලයක් ගත වී තිබූ නමුත් මේ දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**-------------------------------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කන්දවලායි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අදියර III ඉදිකිරීමේ කාර්යය වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට 2017 නොවැම්බර් 30 දින රු.මිලියන 20 ක මුදලක් ගෙවා තිබූ නමුත් මේ දක්වා ඉහත කාර්යය නිම කර නොතිබුණි.

**2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම**

**-------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සම්පාදනයන් පිරිනැමීමේදී කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමිතිය පිළිබඳ සැලකිල්ල යොමු නොකර විශාල ප්‍රසම්පාදන ප්‍රමාණයක් පිරිනමා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව $C_7$ ප්‍රමිතිය දරන කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 10 ට වැඩි කොන්ත්‍රාත් පිරිනැමීය නොහැකි වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 105 ක වටිනාකමින් යුත් කර්මාන්ත 21 ක් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට පිරිනමා තිබුණි. මෙයට අමතරව ප්‍රසම්පාදනයන් පිරිනැමීමේදී අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් වෙනත් ස්ථානවල සිදුකරනු ලබන කර්මාන්ත පිළිබඳ සැලකිල්ල යොමු කර නොතිබුණි. ඒ නිසා අදාළ කර්මාන්ත ඉක්මනින් සහ ගුණාත්මකව ඉටු කිරීමේ අඩුපාඩු ඇති වී තිබුණි.

(ආ) කිලිනොච්චිය රජයේ රෝහල වටා තාප්පය ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදනයේදී කොන්ත්‍රාත්කරුවන් විවිධ වූ මිල ගණන් යටතේ ලංසු ඉදිරිපත් කර තිබුණි. ඒවා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කර තිබූ ලංසු සමඟ නොගැලපෙන බැවින් ප්‍රතික්ෂේප කර තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු ලේඛනයේ අත්සන් යොදා නොතිබූ කොන්ත්‍රාත්කරුට අදාළ කර්මාන්තය පිරිනමා තිබුණි.

**2.4 පාඩු හා හානි**

**-----------------**

කන්දවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක් 2017 ජුනි 16 දින යාපනයේදී අනතුරකට ලක් වීම සම්බන්ධයෙන් වූ පාඩුව පිළිබඳව මුදල් රෙගුලාසි 104(2) ප්‍රකාරව විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පාඩුව සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත විමර්ශන කමිටු පත්කර විමර්ශන කටයුතු සිදුකර නොතිබුණි. මාස 13 ක කාලයක් ගත වී තිබුණද මෙම අනතුර සම්බන්ධයෙන් කිසිඳු වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, අලුත්වැඩියා වියදම වූ රු.1,348,904 කින් රක්ෂණ ආයතනයෙන් රු.830,289 ක් පමණක් ලැබී තිබුණු අතර ඉතිරි මුදල් පාඩුවට වගකිව යුතු අයගෙන් අයකර නොගෙන පොදු අරමුදලෙන් ගෙවා තිබුණි.

## 2.5 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2016 | 3.7 | (i). කන්දවලායි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මහජන උපයෝගීතාවයට සුදුසු අයුරින් නිම කර නොතිබීම.<br>(ii). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 පොදු ජනතාවට 2016 වර්ෂය සඳහා ලබාදිය යුතු ජීවන වියදම් ආධාර මේ දක්වා සම්පූර්ණයෙන්ම ලබා දී නොතිබීම. |
| 2016 | 3.11 | කොන්ත්‍රාත් කාර්යයන් සඳහා වැඩියෙන් ගෙවා තිබූ එකතුව රු.686,492 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබීම. |
| 2015 | 3.16 | 2014 අප්‍රේල් 08 දින පැවති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා තීරණවලට අනුව නිරවුල් නොකරන ලද රු.මිලියන 5.8 ක වී මිලදී ගැනීමේ අත්තිකාරම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග කිසිවක් මේ දක්වා ගෙන නොතිබීම. |

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදන | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| 2013 | පුනරාවර්තන | 151.38 | 148.20 | 3.18 | 2.1 |
| | මූලධන | 50.20 | 49.25 | 0.95 | 1.9 |
| | **එකතුව** | **201.58** | **197.45** | **4.13** | |
| 2014 | පුනරාවර්තන | 145.45 | 141.38 | 4.07 | 2.8 |
| | මූලධන | 41.55 | 41.43 | 0.12 | 0.27 |
| | **එකතුව** | **187.00** | **182.81** | **4.19** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | පුනරාවර්තන | 173.60 | 170.57 | 3.03 | 1.74 |
| | මූලධන | 37.00 | 36.26 | 0.74 | 1.98 |
| | **එකතුව** | **210.60** | **206.83** | **3.77** | |
| 2016 | පුනරාවර්තන | 190.30 | 187.39 | 2.91 | 1.53 |
| | මූලධන | 108.00 | 106.40 | 1.60 | 1.48 |
| | **එකතුව** | **298.30** | **293.79** | **4.51** | |
| 2017 | පුනරාවර්තන | 202.73 | 192.09 | 10.64 | 5.25 |
| | මූලධන | 100.00 | 99.53 | 0.47 | 0.46 |
| | **එකතුව** | **302.73** | **291.62** | **11.11** | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂවලට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී රු.මිලියන 11 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී මූලධන ප්‍රතිපාදන වෙන්කිරීම් සියයට 07 කින් අඩු වී තිබුණත්, 2017 වර්ෂයේදී රු.මිලියන 20 ක මූලධන අරමුදල් භෞතික වත්කම් වශයෙන් ඇති කර නොතිබුණි. එසේම, 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.මිලියන 8.75 ක මූලධන ප්‍රතිපාදන මේ දක්වා අදාළ කාර්යයන් නිම නොකිරීම හේතුවෙන් බැංකුවේ රඳවා තබා තිබුණි.

**2.7 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

වෙනත් අමාත්‍යාංශ 24 ක්, දෙපාර්තමේන්තු 14 ක්, ජනාධිපති සහ අග්‍රාමාත්‍ය කාර්යාල යනාදියෙන් විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එකතුව රු.මිලියන 2,013.31 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එකතුව රු.මිලියන 1,896.82 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 116.49 ක් හෙවත් සියයට 5.78 ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ කලව්යා වැව සහ මුරිප්පු වැව ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් වැඩකටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව පිරිනැමීම හේතුවෙන් රු.131,067 ක පාඩු සිදු වී තිබුණි.

(ආ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ කොට්‍රාන්දාර් වැව් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත් කාර්යය අදාළ කොන්ත්‍රාත්කරු විසින් වැඩ අතරමග නවතා දමා තිබියදී නැවත ලංසු කැඳවීම මඟින් කොන්ත්‍රාත් පිරිනැමීම හේතුවෙන් රු.428,050 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව, කාර්යසාධන ඇපකර රු.379,047 ක් මුදල් කර ආදායමට නොගෙන අදාළ කොන්ත්‍රාත්කරුටම නිදහස් කිරීම නිසා රු.379,047 ක ආදායම් රටට අහිමි වී තිබුණි.

(ඇ) කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ සමාජ සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වට්ටක්කච්චි මහා විදුහල් කලාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යය සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (ආ), (ඇ), 5.3.13 (ඇ) මාර්ගෝපදේශ ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගේ ලංසු ඇප මුදල් රු.257,000 ක් මුදල් නොකර අදාළ කාර්යය වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනැමීම හේතුවෙන් රු.265,156 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල සැලසුම් අංශයෙන් විගණනයට ඉදිරිපත් කරනු ලැබූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට පැවැති හිඟ සේවක ණය ශේෂ එකතුව රු.517,803 ක්ව පැවැති අතර එම හිඟ ශේෂ වර්ෂ 05 කට අධික කාලයක සිට පැවැත එන නමුත් එම හිඟ ශේෂය අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඉ) ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයෙන් නිදහස් කරනු ලැබූ රු.මිලියන 6.88 ක ප්‍රතිපාදන වට්ටක්කච්චි තබාල්කට්ටු මාර්ගය ප්‍රතිසංස්කරණ කාර්යය 2017 නොවැම්බර් 01 දින ගිවිසුමට එළැඹ නිම කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2018 ජුලි 30 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී ප්‍රමිතියෙන් අඩු මූල ද්‍රව්‍ය භාවිතය, කාර්යසාධනයේ දුර්වලතා යනාදි හේතූන් නිසා මාර්ගය අඛණ්ඩව කැඩී ගොස් තිබෙන බව නිරීක්ෂණය විය.

(ඊ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා හින්දු කටයුතු අමාත්‍යාංශයේ රු.මිලියන 2.76 ක ප්‍රතිපාදන මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ පරන්තන් මාර්ගය ප්‍රතිසංස්කරණ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු පමණක් මුදල් ගෙවා ලංසු ලේඛන ලබාගෙන තිබුණි. එසේ වුවත්, එක් කොන්ත්‍රාත්කරුවෙකුගේ සම්පූර්ණ කරන ලද ලංසු ලේඛනයේ ඔහුගේ අත්සන කපා වෙනස් කර ලංසු ලේඛන ලබා නොගත් කොන්ත්‍රාත්කරුවකුට ලබා දීම විගණනයේදී වංචා සහගත ක්‍රියාවක් ලෙස නිරීක්ෂණය විය.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 26801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15.00 | 14.90 | 11.00 | 11.59 | 45.00 | 38.93 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබූ ශේෂවල එකතුව රු.644,195 ක් වූ අතර එම හිඟ ශේෂ වර්ෂ 08 ක සිට 14 ක් දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එමින් තිබුණත් එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.9 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂවල එකතුව රු.මිලියන 41.25 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.මිලියන 0.51 ක තැන්පතු 19 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු.මිලියන 6.55 ක ප්‍රතිපාදන අදාළ නිශ්චිත කාර්යයන් සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

## 2.10 බැංකු ගිණුම් මෙහෙයවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 ජුනි මාසය සඳහා පිළියෙල කරනු ලැබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පෙන්වා තිබූ ගැලපීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දක්වා ඇත.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිකුත් කරනු ලැබූ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු.මිලියන 8.55 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකළ බවට සඳහන් කර ලියන ලද රු.මිලියන 23.46 ක් වටිනා චෙක්පත් 18 ක් 2018 අගෝස්තු 01 දින දක්වා අදාළ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය පාලනය නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 137 සහ 138 ට පටහැනිව ක්‍රියාකර තිබූ බවද නිරීක්ෂණය විය.

## 2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව එහි ඇමුණුම II | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) | පවත්වා නොතිබුණි. |
| ( ඉ) | ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

## 2.12 මානව සම්පත් කළමනාකරණය

### 2.12.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 150.58 ක් වැය කර තිබුණි. ඒ අනුව, ඒක පුද්ගල වියදම රු.මිලියන 0.51 ක්ව පැවතුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 18 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 16 | 01 | 15 | - |
| (iii) | ද්විතියික මට්ටම | 282 | 223 | 65 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 57 | 49 | 08 | - |
| | | 375 | 291 | 90 | 06 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඳවාගෙන තිබූ අතිරික්ත සේවකයන් 06 දෙනා සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති පුරප්පාඩු 90 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 2.13 මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගණන්දීමේ නිලධාරියාට නියමිත කාර්යයන් එකක් හෝ ඊට වැඩි ගණනක මුල්‍ය බලතල පැවරීමේදී පවරන නිලධාරියාගේ නමින් හෝ ධූරයෙන් හෝ නිශ්චිතව සඳහන් කර ඒ ඒ නිලධාරියාට පවරන කාර්යයන් දැක්වෙන ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් ලේඛනය පොදුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංසරණය කර නොතිබුණි.